# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 10/2013**

නො. 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07
2013, සැප්තැම්බර් මස 02 වන දින.

උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**<u>විශ්වවිද්‍යාල සේවිකාවන් සඳහා ප්‍රසූත නිවාඩු සහ මව්කිරිදීමේ සහන කාලසීමාව</u>**

කොමිෂන් සභා චක්‍රලේඛ අංක 719, 759 හා ආයතන චක්‍රලේඛ ලිපි අංක 09/2004 හි ප්‍රතිපාදන නැවත ක්‍රියාවට නංවමින් විශ්වවිද්‍යාල සේවිකාවන් සඳහා ප්‍රසූත නිවාඩු සහ මව්කිරිදීමේ සහන කාලසීමාව සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2006.12.01 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 885, කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

2013.07.18 දින රැස්වූ 877 වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වාරයේදී විශ්වවිද්‍යාල සේවිකාවන් පහත දැක්වෙන පරිදි ප්‍රසූති නිවාඩු සහ මව්කිරිදීමේ සහන කාලසීමාවන් සඳහා හිමිකම් ලබන බව තීරණය විය.

**1. ප්‍රසූති නිවාඩු**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/ උසස් අධ්‍යාපන ආයතන වල ස්ථිර, තාවකාලික, අනියම් හෝ පුහුණුවන සේවිකාවන් හට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිගේ/ ප්‍රධාන විධායක නිලධාරි හෝ ඔහු/ඇය වෙනුවෙන් බලය පවරන ලද නිලධාරියෙකු විසින් ප්‍රසූත නිවාඩු ලබාදිය හැකි ය.

**අ.) වැටුප් සහිත ප්‍රසූත නිවාඩු**

i. නිලධාරිනියකට සෑම සජීවී දරු උපතක් සඳහාම වැඩ කරන දින 84 ක සම්පූර්ණ වැටුප් සහිත නිවාඩුවක් හිමිවේ. දරු ප්‍රසූතිය සිදු වී සති 04 ක් යාමට පෙර නිලධාරිනියට යළිත් රාජකාරියට වාර්තා කිරීමට ඉඩ නොදෙනු ඇත. මෙම වගන්තිය යටතේ නිවාඩු ලබා ගැනීම සඳහා වෛද්‍ය සහතිකයක් හෝ දරුවාගේ උප්පැන්න සහතිකය හෝ ඉදිරිපත් කළ යුතු ය.

ii. ප්‍රසූත නිවාඩු ගණන් බැලීමේදී එම නිවාඩු කාලය තුළට පැමිණෙන රජයේ නිවාඩු, සෙනසුරාදා සහ ඉරිදා දින සහ විශ්වවිද්‍යාල පද්ධතියට අදාල අනෙකුත් නිවාඩු දින ඊට ඇතුළත් නොකළ යුතු ය.

iii. මෙම නිවාඩු කාලය සේවිකාවගේ ඉතිරිව තිබෙන නිවාඩුවලින් අඩු නොකළ යුතු අතර, මෙම නිවාඩු කාලය සම්පූර්ණ වැටුප් සහිත විශේෂ නිවාඩුවක් ලෙසට සැලකිය යුතු ය.

iv. උපතේදීම මරණය සිදුවන දරු උපතකදී හෝ දරු ප්‍රසූතියෙන් සති 06 ක් ඉක්මයාමට පෙර දරුවා මරණයට පත්වන අවස්ථාවක දරුවාගේ මරණ සහතිකය හෝ වෛද්‍ය සහතිකය හෝ ඉදිරිපත් කළ විට විශේෂ වැටුප් සහිත නිවාඩු වශයෙන් දරු උපත සිදු වූ දින සිට සති 06 ක නිවාඩුවක් දිය යුතු ය.

**ආ.) මව්කිරි දීම සඳහා ලබා දෙන සහනය**

ප්‍රසූත නිවාඩුව අවසන්වීමෙන් අනතුරුව දරුවාට මව්කිරිදීම සඳහා පෙරවරුවේදී පැයක කාලයක්ද පස්වරුවේදී පැයක කාලයක්ද වශයෙන් මව්කිරිදීමේ සහන කාලසීමා දෙකක් සඳහා විශ්වවිද්‍යාල සේවිකාවෝ හිමිකම් ලබති. එසේ නැතහොත් කළමණාකාරිත්වයේ එකඟත්වය ඇතිව මේ සඳහා සුදුසු වැඩපිළිවෙලක් යොදා ගැනීමට හැකිය. මෙම සහන කාල ලබාදිය යුත්තේ ප්‍රසූත නිවාඩුව අවසන්වීමෙන් අනතුරුව සේවයට වාර්තා කිරීමෙන් පසු මාස 06 ක කාලයක් සඳහා හෝ දරුවාගේ වයස අවුරුදු 01 සම්පූර්ණ වන හෝ අවස්ථා දෙකින් ප්‍රථමයෙන් පැමිණෙන අවස්ථාව සඳහා පමණි.

**ඇ.) ගර්භණී කාලසීමාව තුළ ලබාදෙන සහන**

මාස 05 ක් වූ ගර්භණී කාලය අවසානයේදී සේවයට වාර්තා කළයුතු සාමාන්‍ය රාජකාරී වේලාවට වඩා පැය භාගයක් ප්‍රමාද වී සේවයට වාර්තා කිරීමටත් නියමිත වේලාවට පැය භාගයක් කලින් සේවා ස්ථානයෙන් පිට වී යාමටත් සේවිකාවට අවසර දෙනු ලැබේ. සේවිකාව ප්‍රසූත නිවාඩු ලබා ගන්නා තෙක් පමණක් මෙම සහනය ලබා දෙනු ලැබේ. වෛද්‍ය නිලධාරියෙකු විසින් ඇය මාස 05 ක ගර්භණී කාලයක් සම්පූර්ණ කර ඇති බව සනාථ කිරීම පිණිස නිකුත් කරන සහතිකයක් සමඟ අදාල සේවිකාව විසින් මෙම සහනය සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු වේ.

**ඈ.) වැටුප් රහිත විශේෂ ප්‍රසූත නිවාඩු**

අ.) හි අනුමත කරන ලද ප්‍රසූත නිවාඩු අවසන් වීමෙන් පසු පහත i සහ ii, අවස්ථාවන් හි සඳහන් කොන්දේසි සපුරන්නේනම් මාස 06 ක උපරිමයකට යටත්ව වැටුප් රහිත විශේෂ ප්‍රසූත නිවාඩුවක් සේවිකාව හට ලබාදිය හැකි ය.

i. උපතේදීම දරුවා අසාමාන්‍ය තත්වයක සිටි බව ප්‍රසව හා නාරි රෝග පිළිබඳව රජයේ වෛද්‍ය විශේෂඥයකු සහතික කොට ඇත්නම්, එවැනි දරුවන් සම්බන්ධව ලබා ගත් සාමාන්‍ය ප්‍රසූත නිවාඩු අවසන් වන අවස්ථාවකදි එම දරුවා තවදුරටත් අසාමාන්‍ය තත්වයක සිටින බව හා ඒ නිසා මවගේ විශේෂ පෞද්ගලික රැකවරණය හා අවධානය එම දරුවාට තවදුරටත් අවශ්‍ය බව රජයේ ළමා රෝග වෛද්‍ය විශේෂඥයකු සහතික කරන අවස්ථාවක,

ii. දරුවාගේ උපත නිසා වෙනත් රෝගාබාධ ඇතිවීම හේතුවෙන් මවට තවදුරටත් විවේකය අවශ්‍ය වන බව ප්‍රසව හා නාරි රෝග පිළිබඳව රජයේ වෛද්‍ය විශේෂඥයකු සහතික කරනු ලබන අවස්ථාවක.

iii. ඉහත ii. හි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් හැර මෙම නිවාඩු අනුමත කරනුයේ දරුවා ජීවතුන් අතර සිටින කාලය තුළ පමණි. නිවාඩු ලබාදෙනුයේ දරුවා රැකබලා ගැනිමට බැවින්, යම් හෙයකින් දරුවා මියගියහොත් එයින් දින හතකට පසු මෙම නිවාඩු අවලංගු වූවාසේ සැළකේ.

iv. ඉහත විධිවිධාන අනුව ලබාදෙන ලද නිවාඩු වැටුප් වර්ධක කාර්යයන් සඳහා හෝ විශ්‍රාම වැටුප් සඳහා හෝ බාධාවක් නොවිය යුතුය. ඇයගේ

වැටුප් රහිත නිවාඩු කාලය තුළ ඇති වන පුරප්පාඩුවලදී, උසස්වීම් ලබා දීම සඳහා ද එම නිවාඩු කාලය බාධාවක් සේ නොසැලකිය යුතු ය.

v. ආයතන ප්‍රධානියාට දැනුම් දීමෙන්, සේවිකාවගේ කැමැත්ත අනුව මෙම නිවාඩුවෙන් කොටසක් පමණක් ලබාගෙන ඉතිරිය අවලංගු කර සේවයට වාර්තා කළ හැකි ය.

vi. ඉහත i හා ii, කොන්දේසීන්ගෙන් බැහැරව සේවිකාව විසින් මෙම නිවාඩු භාවිතා කරන්නේයැයි යම්හෙයකින් හැඟී ගියහොත් එම නිවාඩු අවලංගු කළ හැකි අතර සේවිකාව වහාම නැවත සේවයට වාර්තා කළ යුතු ය.

vii. මෙම විශේෂ ප්‍රසූත නිවාඩු ගණන් බැලීමේදී එම කාලය තුලට පැමිණෙන රජයේ නිවාඩු, සෙනසුරාදා, ඉරිදා දින සහ විශ්වවිද්‍යාල ක්ෂෙත්‍රයේ විශේෂ නිවාඩු දින ඊට ඇතුළත් කළ යුතු ය.

viii. මෙම නිවාඩු ලබාදීමට පෙර සේවිකාවට ලබා දෙන ලද ණයක හෝ අත්තිකාරමක, මාසික වාරික අයකර ගැනීම සඳහා සතුටුදායක වැඩ පිළිවෙලක් ආයතන ප්‍රධානියා විසින් සකසා ගත යුතු ය.

ඒ අනුව, කොමිෂන් සභා චක්‍රලේඛ අංක 719, 759, 885 හා ආයතන චක්‍රලේඛ ලිපි අංක 09/2004 හි ප්‍රතිපාදන, එකී චක්‍රලේඛ විධිවිධාන අනුව මේ වන විට ලබාදුන් ප්‍රසූත නිවාඩු වලට බාධාවක් නොවන සේ අවලංගු වේ.

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ/කළේ: මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම
සභාපතිනිය

පිටපත්:
1. ලේකම්/ උසස් අධ්‍යාපන අමාත්‍යංශය
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති කාර්යාලය
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින්
5. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල වල ලේඛකාධිකාරිවරුන්
8. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරී
9. විශ්වවිද්‍යාල වල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන වල පුස්තකාලයාධිපතිවරුන්/ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන්/ජ්‍යෙ.ස.ලේ /ස.ලේ
12. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන්/ජ්‍යෙ.ස.මු/ස.මු
13. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක
14. විශ්වවිද්‍යාල වල රජයේ විගණන අධිකාරිවරුන්
15. උසස් අධ්‍යාපන ආයතන වල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්/ ස.අ.වි
16. වෘත්තීය සමිතිවල ලේකම්වරුන්
17. විගණකාධිපති

ගොනු අංකය: යූ.ජී.සී./එච්.ආර්./6/4/12